# පළාත් මාර්ග ව්‍යාපෘතිය - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (ව්‍යා.ස.ඒ.) 2010 මාර්තු 31 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.

1. **මතය.**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදලි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක තැන්පතුව සහ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන.**

-------------------

2.1 **මූල්‍ය කාර්යය සාධනය.**

-----------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ- ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම රු.19,782,300 ක් විය. 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දින දක්වා පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| ලී බඩු හා සවි කිරීම් | 2,799,630 |
| කාර්යාලයීය උපකරණ | 2,358,828 |
| මෝටර් වාහන | 3,806,926 |
| පොත් | 18,000 |
| උපදේශක සේවා | 1,127,500 |
| පුහුණු | 3,008,254 |
| වර්ධක හා මෙහෙයුම් පිරිවැය | 6,663,162 |
| එකතුව | 19,782,300 |

## 2.2 විශේෂ ඩොලර් ගිණුම.

මූලාශ්‍ර ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ඌව පළාත, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - නැගෙනහිර පළාත සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - උතුරු පළාත සඳහා වෙන් වශයෙන් විශේෂ (ඩොලර්) ගිණුම් 4 ක් විවෘත කර තිබුණි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (ව්‍යා.ස.ඒ.) විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| ලැබුණු ආරම්භක අත්තිකාරම | 826,087 | 93,144,200 |
| එකතු කළා | | |
| ඌන පූරණය කිරීම් | නැත | නැත |
| | 826,087 | 93,144,200 |
| අඩු කළා | | |
| ආපසු ගැනීම් (ප්‍ර.වි.ආ.) | 85,886 | 9,557,958 |
| විදේශ විනිමය පාඩුව | -- | 1,458,705 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 740,201 | 82,127,537 |